# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1807/13 - 2013 අප්‍රේල් මස 24 වැනි බදාදා - 2013.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### බලපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන බලපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

උප සභාපති වන අජන්ත ගුණරත්න ද සිල්වා නම් වූ උප සභාපති අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්වන්නා වූ ද, ඒ බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වරදාන සරත් සමරජීව ද සිල්වා මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බලපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම වරදාන සරත් සමරජීව ද සිල්වා මහතා බලපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරි,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 17 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

05 - 206/1

1A - G 17572— 350 (2013/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යාම හේතු කොට ගෙන බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අජන්ත ගුණරත්න ද සිල්වා නම් වූ සභිකයා අයත් වන්නාවූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු වන අගම්පොඩි සිරිල් ද සිල්වා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

බලපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම අගම්පොඩි සිරිල් ද සිල්වා මහතා බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරි,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 17 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

05 - 206/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.